# සේනාසන: වර්ගීකරණය හා ඉදිකිරීම (ත්‍රිපිටකය හා තදනුබද්ධ විවරණ ග්‍රන්ථ ඇසුරෙන් කෙරෙන විමසුමක්)

**- ආධුනික කථිකාචාර්ය ජම්බුගහපිටියේ ධම්මාලෝක හිමි**

බුදුදහමේ දාර්ශනික හරය ගැබ් කරගත් සාහිත්‍යය වනාහි ත්‍රිපිටකය යි. එහි පශ්චාත්තන සංවර්ධනයන් කිහිපයක් හැරුණු විට බොහෝ ග්‍රන්ථ ප්‍රමාණයක් බුදුදහමේ ඉගැන්වෙන පරමාර්ථ සත්‍යයට හා ධාර්මික දිවි පැවැත්මට අනුකූල තථාගත දේශනාවන් බව පැහැදිලි ය. තව ද පශ්චාත්කාලීන සංවර්ධනයන් වුව ද මූලික බුදුදහමේ දර්ශනයට අනුකූල බව ආචාර්ය මතය යි. එනිසා ත්‍රිපිටකය, එමෙන් ම එහි අර්ථ විග්‍රහයන් වූ අටුවා හා ටීකා ද ලොව යථාර්ථය ඉදිරිපත් කිරීම හා මිනිසාගේ සාංසාරික විමුක්තිය අරමුණු කරගෙන සංග්‍රහ කර ඇති බව පිළිගනු ලැබ ඇත. එහෙත් ඉන් ඔබ්බට ගොස් ත්‍රිපිටක සාහිත්‍යය පිළිබඳ ශාස්ත්‍රීය විමසීමක් කරන්නෙකුට විවිධ පර්යේෂණ ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ඉන් සපයා ගත හැකි තොරතුරු විශාල ප්‍රමාණයකි. එනිසා මෙහි දී අපගේ අවධානය යොමු වන්නේ ත්‍රිපිටක සාහිත්‍යයත් තදනුබද්ධ ව රචනා වූ විවරණ ග්‍රන්ථත් ආශ්‍රයෙන් 'සේනාසන හා සේනාසන ඉදිකිරීම' පිළිබඳ ව විමසීමක් කිරීමට යි.

මිනිසාගේ යැපීම සඳහා අත්‍යවශ්‍ය සාධක සතරෙන් එකක් වනුයේ වාසස්ථානය යි. එනම් විසීම සඳහා අවශ්‍ය ආරක්ෂක ස්ථානය යි. බුදුදහම පහළ වූ සමයේ විවිධ ශ්‍රමණයන් විසින් නොයෙක් ආකාරයේ වාසස්ථානයන් භාවිත කරන ලද බවට බොහෝ තොරතුරු උපනිෂද්, බෞද්ධ හා ජෛනාදි අන්‍යාගමික



මූලාශ්‍රයයන් ඇසුරෙන් ද සපයා ගත හැකි ය. එසේ වුව ද භික්ෂුවගේ සතර නිඃශ්‍රය ධර්මවලට අනුව උන්වහන්සේ නිරන්තරයෙන් වෘක්ෂමූලික වීමට උත්සාහ කළ යුතු ය. එය භික්ෂුවගේ උරුමයක් බව ද භික්ෂුවගේ විමුක්තිය අරමුණු කරගෙන යන ගමන වේගවත් කරන බව ද ධර්මය විසින් පැහැදිලි කර තිබේ. 'ඉදිකරන ලද කිසියම් ආකාරයක සෙනසුනක් ලැබීම අතිරේක ලාභයක් ය.' යන්න බුදුදහමේ ස්ථාවරය යි.[1] එසේ වුව ද බුදුරජාණන් වහන්සේ විසින් ම විවිධ විහාරාරාමයන් පිළිගන්නා ලද අතර ඒ පිළිබඳ විවිධ විනය නීති-රීති ද පනවනු ලැබ තිබේ.

දිනක් භික්ෂූන් හමු වූ රජගහනුවර සිටුවරයා විහාරයක් කරවීම සඳහා එම භික්ෂූන්ගෙන් අවසර පැතුවේ ය. ඒ වන විට බුදුරජාණන් වහන්සේ විහාර පිළිගැනීම සඳහා භික්ෂූන්ට අනුදැන වදාරා නොතිබූ අතර භික්ෂූහු වැඩ විසුවෝ රුක්මුල්, පර්වත, ගල්ලෙන්, සොහොන්, වනපෙත්, එළිමහන් හා පිදුරු ගොඩවල් යන තැන්හි ය.[2] මේ නිසා භික්ෂූන් බුදුරදුන් හමු වී ඒ පිළිබඳ ව විමසන ලදු ව බුදුන් වහන්සේ විසින් විහාර පිළිගැනීම සඳහා භික්ෂූන්ට අවසර ලබා දෙන ලද අතර භික්ෂූන් සඳහා සුදුසු සෙනසුන් පසක් ද සඳහන් කරන ලදී.[3] භික්ෂූන් සඳහා කිසියම් වාසස්ථානයක් අනුදක්නා ලද බවට පළමුවරට තොරතුරු හමු වන්නේ මෙම ස්ථානයේදී ය. ඒ පිළිබඳ ව භික්ෂූන් වෙතින් තොරතුරු දැනගත් රජගහනුවර සිටුවරයා එක් දිනකින් ම විහාර සැටක් කරවා භික්ෂූන් වහන්සේ විෂයෙහි පූජා කළ බව සේනාසනක්ඛන්ධකයෙහි දැක්වේ.[4] මෙම කරුණ වැදගත් වන්නේ බුදුරදුන් විසින් කවර අන්දමේ සෙනසුන් දක්වා තිබුණ ද රජගහනුවර සිටුවරයා එක් දිනකින් විහාර සැටක් කරවීම ඒ කිසිදු ආකාරයක විහාරයක් ඔහු විසින් නොකරවන ලද බවට සාක්ෂ්‍යයක් වන බැවිනි. සේනාසනක්ඛන්ධකයේ අනතුරු ව දැක්වෙන විස්තරවලින් ඔහු විසින් ඉදිකරන ලද්දේ කවර අන්දමේ විහාර ද යන්න පැහැදිලි වේ. මේ නිසා අනේපිඬු සිටුවරයා, විශාඛා උපාසිකාව වැන්නවුන් විසින් භික්ෂූන් විෂයෙහි

ඉතා දියුණු විහාර සංකීර්ණ ඉදිකොට පූජා කරන ලද්දේ වුව ද සාමාන්‍යයෙන් මුල් යුගයේ දී සරල, ප්‍රාථමික මට්ටමේ සෙනසුන් ඉදිකර දුන් බව තහවුරු වේ.

සරල විග්‍රහ කිරීමකට අනුව සෙනසුන යන්න වාසස්ථානය යනුවෙන් හැඳින්විය හැකි නමුත් ඒ පිළිබඳ විග්‍රහය ඊට වඩා සංකීර්ණ බව මූලාශ්‍රයයන් විමසීමෙන් පැහැදිලි වේ. පොදුවේ සලකන කල සේනාසන සඳහා ආවාස, විහාර, අගාර වැනි පද භාවිත කර ඇති බව පෙනී යයි. දීඝනිකාය ටීකාවට අනුව 'සේනාසන' යන්න සයන හා ආසන යනුවෙන් වර්ග කළ හැකි ය. ''යම් තැනක (ඇඳක හෝ විහාරයක හෝ) වැතිරෙයි ද නිදයි ද එය 'සෙන' නම් වේ.[5] යම් තැනක (පුටු ආදියෙහි) හිඳියි ද එය ආසන නම් වේ. මේ දෙක එක් ව ගෙන 'සේනාසන' යනුවෙන් හඳුන්වනු ලැබේ.''[6] සුමංගලවිලාසිනී, මනොරථපූරණී හා චුල්ලනිද්දේස අටුවාව යන අටුවා සේනාසන යන්නට මෙයට වඩා සරල විග්‍රහයක් ඉදිරිපත් කර තිබේ. එම මූලාශ්‍රයවලට අනුව යම් තැනක භික්ෂුව සිටියි ද එතැන සේනාසන නම් වේ. ඊට ඇඳ, පුටු, බිසි (ගුදිරි), විහාර, අඩ්ඪයෝග, පාසාද, හම්මිය, ගුහා, ලෙන්, අට්ට, මාළ, වෙළුගුම්බ (උණපඳුරු), රුක්මුල් යන පසළොස ඇතුළත් කර තිබේ.[7] මෙම විග්‍රහය අනුව පෙනෙන්නේ භික්ෂුවට පහසුව සලසන ස්ථාන මෙන් ම පහසුව සලසන දෑ ද සෙනසුන් ගණයට අයත් වන බව යි. ඒ පිළිබඳ කදිම විග්‍රහයක් සාරත්ථදීපනී නම් චුල්ලවග්ග ටීකාවෙහි දැක්වෙයි. ''සෙනසුන් විහාර සේනාසන, මඤ්චපීඨ සේනාසන, සන්ථත සේනාසන හා ඕකාස සේනාසන යනුවෙන් සිව්වැදෑරුම් වේ. එහි ඇඳ ද සෙනසුනකි. පුටුව ද බිස්ස ද කොට්ටය ද විහාරය ද අඩ්ඪයෝගය ද ප්‍රාසාදය ද හම්මිය ද ගුහාව ද අට්ටය ද මාළය ද ලෙණ ද උණ පඳුර ද රුක්මුල් ද මණ්ඩපය ද සේනාසනයෝ ය. යම් තැනක භික්ෂුව සිටියි ද ඒ සියල්ල සේනාසන නම් වේ. වචන වශයෙන් ගත් කල විහාර, අඩ්ඪයොග, ප්‍රාසාද, හම්මිය හා ගුහා යන මේවා විහාර සේනාසන නම් වේ. ඇඳ, පුටු, බිසි, කොට්ට ආදි මේවා මඤ්චපීඨ සේනාසන නම් වේ. කොට්ට උර, සම්කඩ, තණ ඇතිරිල්ල වැනි දේ සන්ථත සේනාසන නම් වන



අතර යම් තැනකින් භික්ෂූන් ඉවත් ව යයි ද එතැන ඕකාස සේනාසන නම් වේ.''[8] මෙම විග්‍රහය අනුව පැහැදිලි වනුයේ භික්ෂූන් වාසය කරන ස්ථාන මෙන් ම විහාරයක භාවිත කෙරෙන උපකරණ සහ ඒ හා බැඳුණු දෑ ද සේනාසන වශයෙන් සැලකෙන බව යි.

මෙයට වෙනස් වූ අසේනාසන හා සේනාසන යනුවෙන් කෙරෙන වර්ගීකරණයක් සමන්තපාසාදිකාවේ දී හමු වේ.[9] එහි දී චේතියඝර (චෛත්‍ය ගෘහ), බෝධිඝර (බෝධි ගෘහ), ආසනඝර (ආසනයක් තැනපත් කොට තනන ලද ගෘහය), සම්මුඤ්ජනිඅට්ට (?), දාරුඅට්ට (දැවමය අට්ටාලය), වච්චකුටි (වැසිකිළිය), ඉට්ඨකසාලා (ගඩොලින් බඳින ලද හෝ උළු සෙවිළි කරන ලද ශාලාව), වඩ්ඪකීසාලා (දැවමය ශාලාව?), ද්වාරකොට්ඨක (දොරටු කොටුව), පානීයමාළො (පැන්හල), මග්ග (මාර්ගය), පොක්ඛරණී (පොකුණ) යන මේවා අසේනාසන ලෙසත් විහාර, අඩ්ඪයෝග, පාසාද, හම්මිය, ගුහා, මණ්ඩප, රුක්ඛමූල (රුක් මුල්), වෙළුගුම්බ (උණ පඳුර) යන මේවා සේනාසන ලෙසත් වර්ග කර ඇත.

කෙසේ වුව ද මෙබඳු සෙනසුන් භාවිතය බුදුරදුන් විසින් අනුදක්නා ලද්දේ අරමුණු කිහිපයක් හේතු කොට ගෙන බව පෙනේ.[10]

1. ශීත හා උෂ්ණය දුරු කිරීම.
2. ශීත සුළං හා වැසි බැහැර කිරීම.
3. චණ්ඩ මෘගයන්ගෙන් හා බඩගා යන සතුන්ගෙන් වන උපද්‍රව දුරුකිරීම.
4. නපුරු අව්සුළං ආදිය දුරු කිරීම.
5. එකලා ව හිඳ ධ්‍යාන වැඩීම හා විදසුන් වැඩීම පහසු කිරීම.
6. දායකයාට මනා ව ධර්ම ශ්‍රවණය කිරීමට පහසුකම් සැලසීම.

බුදුරජාණන් වහන්සේ විසින් මූලික ව ම භික්ෂූන් වහන්සේගේ වාසය සඳහා අනුදැන වදාරා ඇත්තේ සෙනසුන්

වර්ග පහකි.[11] ඒවා හඳුන්වා ඇත්තේ 'ලෙන්' යන නමිනි. එහෙත් පටිසම්භිදාමග්ගයේ දී ඒවාට 'අගාර' යන පදය භාවිත කර ඇත.[12] ඒවා නම් විහාර, අඩ්ඪයෝග, පාසාද, හම්මිය හා ගුහා ය. එහෙත් සෙනසුන් පිළිබඳ අටුවා විස්තරවල දී මෙම පස්විධ ලෙන්වලට අමතර ව වෙනත් සෙනසුන් ගණනාවක් පිළිබඳ විස්තර අපට හමු වේ. ඉන් පෙනී යන්නේ මෙම මූලික ලෙන් පසට අමතර ව විවිධාකාරයේ සෙනසුන් භික්ෂූන් විසින් පරිහරණය කරන ලද බව යි. මෙම සෙනසුන් පිළිබඳ අටුවා විස්තර යම් ප්‍රමාණයකට ගැටලු සහගත වන්නේ ඒ ඒ මූලාශ්‍රයවල දී ඒවා විස්තර කෙරී ඇති ආකාරයේ විෂමත්වය නිසා වුව ද ඉන් ගම්‍ය වන්නේ කාලීන ව සෙනසුන්හි සිදු වූ විපර්යාසයන් යැයි සිතිය හැකි ය. මූලාශ්‍රයන්හි හමුවන එම සේනාසන මෙසේ ලැයිස්තුගත කළ හැකි ය.

- විහාර - ප්‍රාකාරයකින් වට කරන ලද සම්පූර්ණ භික්ෂු ආවාසය හෝ ඉදිරිපස දීර්ඝ වූ ආකාරයකින් සකසන ලද ආවාසය යි.[13]

- අඩ්ඪයොග - දීර්ඝ (ඍජුකෝණාස්‍රාකාර) වූ ප්‍රාසාදය යි. ඇතැමෙකු මෙය ගුරුළෙකුගේ ස්වරූපයට අනුව තනවන ලද්දකැ'යි ප්‍රකාශ කරන බව සුමංගලවිලාසිනීය දක්වයි. එසේ නැතහොත් එක පැත්තක බිත්ති ඉතා උසට තනා අනෙක් පස බිත්ති මිටි ව තනා සකසන ලද සෙනසුන යි.[14] මහානිද්දේස අටුවාව මෙය හඳුන්වන්නේ 'නිකුණ්ඩගෙහ' යනුවෙනි.[15]

- පාසාද - මෙම සේනාසනය ප්‍රාසාදය යන නමින් හඳුන්වනු ලබන්නේ එය, සොම්නස දනවන බැවිනි.[16] ඉන් අදහස් කෙරෙන්නේ චතුරස්‍රාකාර හෝ ආයතචතුරස්‍රාකාර (ඍජුකෝණාස්‍රාකාර) ප්‍රාසාදය යි.[17] සාරත්ථදීපනීටීකාවේ දී සඳරැස් මනා ව වැටෙන සේ සකසන ලද මලුවක් (සඳලුතලයක්?) සහිත මුදුනෙහි වැස්මක් ඇති ප්‍රාසාදය මුණ්ඩකච්ඡදනපාසාද ලෙස හඳුන්වා තිබේ.[18] මෙම ප්‍රාසාද නමැති සේනාසනය



පිළිබඳ ව මූලාශ්‍රයයන්හි නිරන්තරයෙන් තොරතුරු හමු වේ. මනෝරථපූරණීයෙහි එන සඳහනකට අනුව විශාඛාව විසින් කරවන ලද මිගාරමාතුප්‍රාසාදය කාමර දහසකින් යුක්ත වූවකි.[19] එය මහල් දෙකකින් යුක්ත වූ බවත් පළමු මහලේ කාමර පන්සියයක් ද දෙවන මහලේ කාමර පන්සියයක් ද වූ බව සුත්තනිපාත අටුවාව කියයි.[20] ඊට අමතර ව හයසියපනහක් ගෘහයන් ද පන්සියයක් සුළු ප්‍රාසාදයන් ද පන්සියයක් දීර්ඝ ශාලාවන් ද එහි වූ බව සුමංගලවිලාසිනීය කියයි.[21] එමෙන් ම මෙබඳු ප්‍රාසාද මල්කම්, ලියකම්, රන්කම් ආදි නොයෙක් විසිතුරු දෙයින් අලංකාර කරන ලද බවට ද සාධක හමු වේ.[22] එසේ ම සේනාසනක්ඛන්ධකය දක්වන අන්දමට විශාඛා උපාසිකාව විසින් එක් අවස්ථාවක ඇත් කුඹු සටහන් මත්තෙහි ටැම් බැඳ ඉස්තෝප්පුවක් සහිත ප්‍රාසාදයක් කරවා භික්ෂු සංඝයාට පිදීමට කැමති වූ විට[23] බුදුන් වහන්සේ විසින් සියලු ආකාරයේ ප්‍රාසාද පිළිගැනීමට භික්ෂූන්ට අවසර දී ඇත.[24] මේ නිසා භික්ෂූන් විෂයෙහි සැම විට ම එක ම ආකෘතියේ ප්‍රාසාදයන් නො ව විවිධාකාරයේ ප්‍රසාදයන් පිදූ බව සිතිය හැකි ය.

- හම්මිය - මුදුන සෙවිළි කොට ඇති ප්‍රාසාදය හෝ මුදුන සෙවිළි කරන ලද සඳරැස් මනා ව පතිත වන ලෙස සකසන ලද මලුවක් (සඳලුතලයක්?) සහිත ආවාසය යි.[25]

- ගුහා - හුදු පර්වත ගුහාව යි.[26] ඇතැම් තැනක පස්වලින් තැනුණු ගුහාව ගුහා නාමින් වෙසෙසා ඇත.[27] කෙසේ වුව ද ගුහා ඉට්ඨකාගුහා (ගඩොල් හා උළු භාවිතයෙන් තැනූ ගුහා), සිලාගුහා (ශෛලමය ගුහා), දාරුගුහා (දැවයෙන් තැනූ ගුහා) හා භූමිගුහා (පොළොව සාරා ඉදිකරන ලද ගුහා) යනුවෙන් සිව්වැදෑරුම් බව සමන්තපාසාදිකාව දක්වයි.[28] එහෙත් මජ්ඣිමනිකාය ටීකාවට අනුව ඇත්තේ ගුහා තෙවගකි. එනම් පංසුගුහා (පස සාරා තනනු ලබන ගුහා - මෙය ජලය රහිත

තැන්වල ඉදිකරනු ලැබේ.), පාසාණගුහා (ගල් කැණ තනනු ලබන ගුහා) හා මිස්සකගුහා (පස් හා ගල් දෙක ම ඇසුරින් තැනුණු ගුහා) යනුවෙනි.[29]

- අට්ට - විරුද්ධ රජවරුන් වැළැක්වීමට සුදුසු වූ මහල් සතර පහකින් යුක්ත වූ ගොඩනැගිලි විශේෂයකි (බලකොටු බඳු ගෘහ විශේෂයක්?).[30] ඝන බිත්තිවලින් යුක්ත හා ගොණැසි (වක් වූ යටලී) යොදා උළු සෙවිළි කරන ලද වහලක් සහිත ගෘහය යි. අට්ටාලයක (උස් වූ මුරගෙයක) ආකාරයෙන් තනවන ලද ගෘහය ද මෙනමින් හඳුන්වා ඇත.[31] දොරටු සහ අටලු සහිත ගෙයට ද මෙම නම භාවිත ව ඇත.[32]

- ලෙන - මෙහි නිරුක්ත්‍යර්ථය සැඟවෙන ස්ථානය යනු යි. සැඟවෙනුයේ යම් තැනක ද එය ලෙන නම් වේ.[33] එහෙත් සෙනසුනක් ලෙස ගත් විට ලෙන යනු දොරටුවක් යොදන ලද පබ්භාරය යි.[34] එනම් කන්දක් බිඳී යෑමෙන් තැනුණු ගුහාවක් වැනි කොටස යි.[35] සීමාව බිඳීමෙන් සැදුණු සිදුරු ඇති පර්වතයන්හි වූ ලෙන් මෙනමින් හැඳින්වෙන බව දක්වා තිබීමෙන් මෙම අදහස තවදුරටත් තහවුරු වේ.[36] පොදුවේ පර්වත ගුහාවට ද ඇතැම් තැනක 'ලෙණ' යන පදය භාවිත ව ඇත.[37] එහෙත් වෙනත් තොරතුරුවලට අනුව පෙනී යන්නේ ලෙන මනා ව සකස් කරන ලද සංකීර්ණ භික්ෂු ආවාසයක් බව යි. සක්කපඤ්හ සූත්‍ර අටුවාවට අනුව ලෙන බිත්ති බැඳ දොර, කවුළු යොදා විසිතුරු මල්කම් හා ලියකම්වලින් අලංකාර කොට තනවන ලද්දකි.[38] සූකරඛත ලෙන මේ ආකාරයට තනවන ලද්දකි. මුලින් ඌරන් විසින් සාරන ලද්දක් වූ එහි හාත්පසින් පස් ඉවත් කොට ගැඹුරට සාරා මනා ව සකස් කර ඇත.[39] එහෙත් දොරටු රහිත ලෙන් ද වූ බවට සාධක ඇත.[40] කෙසේ වුව ද ලෙනක් විශාල ලෙස තැනීමට ද විනයෙන් අවසර ලබා දී තිබේ.[41]



- මාළ - එක් කුළු ගෙයක් සහිත නොයෙක් කොන් ඇති ගෘහ විශේෂයකි. වටකුරු ව තනවන ලද සෙනසුන ද මෙනමින් හඳුන්වා ඇත.[42]

- කූටාගාර - මුදුන් කොතක් හෝ කොත් දෙකක් යොදා තැනිය යුතු ප්‍රාසාදය යි.[43] සංයුත්තනිකාය අටුවාව පෙන්වා දෙන්නේ එක් කොතක් ඇති ගෘහය කූටාගාරය බවත් එබඳු කොත් දෙකක් යෙදූ ගෙය කූටාගාර ශාලාව බවත් ය.[44] මෙම කුළුගෙයක හෙවත් කූටාගාරයක ප්‍රමාණය පිළිබඳ හෝඩුවාවක් ධම්මපදට්ඨකථාවේ තයොජන වස්තුවෙන් සපයා ගත හැකි ය. ඇතැම් කොතක් ලෙනක දොරටුව වැසීමට තරම් විශාල වූ බව ''රාත්‍රියෙහි කුළුගෙයක් පමණ ගලක් පෙරළී'විත් දොරටුව වැසුණේ ය.'' යනුවෙන් සඳහන් කර තිබීමෙන් පැහැදිලි වේ.[45]

- උද්දණ්ඩ - එක් දොරටුවක් ඇති දීර්ඝ ප්‍රාසාදය යි.[46] (කිසියම් පතිස්සය? විශේෂයකි.) වහලවල් තුනකින් යුතු ගෘහයකැ'යි ඇතැම් තැනක දක්වා ඇත.[47]

- කුටි - මනා ව පිරියම් කරන ලද ගෘහයක් මෙනමින් හඳුන්වා ඇත.[48] ඇතුළත පමණක් සුණු පිරියම් කොට හෝ පිටත පමණක් සුණු පිරියම් කොට හෝ ද නැතහොත් ඇතුළත පිටත දෙක ම සුණු පිරියම් කොට ද මෙම කුටි තනා තිබේ.[49] එහෙත් තනි භික්ෂුවකගේ භාවිතය සඳහා ඉදිකරන ලද දැවමය කුඩා ගෘහය ද මෙනමින් හඳුන්වා ඇත.[50]

- කුටික - දඬුවලින් ඉදිකොට තෘණ විශේෂයන් සෙවිළි කොට තනන ලද්දකි.[51] මෙය දොරටුවක් සහිත ව ද ඉදිකොට ඇත.[52] ගංගාතීරිය තෙරුන්ගේ වස්තුවට අනුව තල්පත් තුනකින් ද මෙබඳු සෙනසුනක් ඉදිකර ගත් බව පෙනේ.[53] පාරාජිකපාලියේ දුතියපාරාජික විස්තරය අනුව මැටියෙන් තනා තණ, දැව හා ගොම යොදා දැවීමෙන් කුටිකය ඉදිකර ඇතැ'යි පෙනේ.[54] සත්මහල් පහයක් වුව

ද තෘණ සෙවිළි කර ඇත්තේ නම් එය 'තිණකුටික' නමින් හඳුන්වනු ලබන බව සමන්තපාසාදිකාව කියයි.[55] මෙහි ප්‍රභේද ගණනාවක් වූ බව සමන්තපාසාදිකාව විමසීමෙන් පැහැදිලි වේ.[56]

- රුක් සිදුරක් තුළ ලෑල්ලක් පියස්ස ලෙස රඳවා දොරටුවක් යොදා සකස් කරගත් සෙනසුන
- ගස සිඳ කණුව (ගස සිඳීමෙන් පසු ඉතිරි වූ කඳ කොටස) මත ලෑලි පියස්සක් යොදා තනන සෙනසුන
- විශාල දෙබලක අට්ටාලයක් බැඳ එහි පියස්ස ලෙස ලෑල්ලක් යොදා තනන සෙනසුන
- සොහොනෙහි සකසනු ලබන සෙනසුන
- ස්තම්භයන් සතරක් මත කුඩයක් යොදා දොරටුවක් ද යොදා තනනු ලබන සෙනසුන (මෙය 'ඡත්තකුටිකා' නමින් හැඳින්වේ.)
- මහත් වූ ඇතිළියක් කණු සතරක් මත්තෙහි යොදා තනන සෙනසුන

'කුටික' යන්න නිරුක්ති විග්‍රහයට අනුව හා ව්‍යාකරණාත්මක විග්‍රහයට අනුව සැලකූ කල 'කුඩා කුටිය' යන අර්ථය ජනිත කරන නමුත් ඉහත කරුණු පිරික්සීමෙන් පැහැදිලි වන්නේ කුටික යන්න කුටියට වඩා ගෘහ නිර්මාණ ශිල්පීය තාක්ෂණයෙන් තරමක් ප්‍රාථමික මට්ටමේ වූවක් බව යි. ඉහත දක්වන ලද සෙනසුන්වලට අමතර ව නළාගාර, තිණාගාර, උච්ඡාගාර හා වත්ථාගාර නමින් හඳුන්වන ලද සෙනසුන් ද භික්ෂූන්ගේ වාසය සඳහා භාවිතයට ගෙන ඇති අතර ඒවායේ ද දක්නට ලැබෙන්නේ ප්‍රාථමික තාක්ෂණයකි. නළාගාරය බට ලී දඬුවලින් තනා තණ සෙවිළි කරන ලද්දකි.[57] තිණාගාරාදිය ද එබඳු සෙනසුන් විශේෂයක් බව පෙනේ.[58]

මීළඟට විමසා බැලිය යුත්තේ විහාරාංග පිළිබඳව යි. ඉහත දක්වන ලද සෙනසුන් ප්‍රමාණයෙන්, හැඩතලවලින්,



අමුද්‍රව්‍යවලින්, විචිත්‍රත්වයෙන් මෙන් ම තාක්ෂණයෙන් ද විවිධත්වයක් ගනු ලබන අතර එනිසා ම ඒ ඒ සෙනසුන් සඳහා එකතු කර ඇති විහාරාංගවල ද විවිධත්වයක් පවතී. එහෙත් කුඩා ප්‍රමාණයේ සෙනසුන්වලට අමතර අංග කිසිවක් එකතු වී නොමැති තරම් ය. ඇතැම් විට ලෙන්, කුටි, ගුහා, මාළ, අට්ට, කූටාගාර වැනි සෙනසුන් මහා සෙනසුන්වල අංග බවට ද පත්ව ඇත.[59] කෙසේ වුව ද මූලාශ්‍රයවලට අනුව විහාරයකට අදාළ ව අංග විශාල ප්‍රමාණයක් එකතු කර තිබූ බවට සාධක ඇත. මේ පිළිබඳ කදිම විස්තරයක් මහාවග්ගපාළියේ දී හමු වේ. ඊට අනුව පරිවෙණ (පිරිවෙණ - භික්ෂු කුටියක්), කොට්ඨක (කොටුගෙය), උපට්ඨානසාලා (උපස්ථාන ශාලාව, හමු වී පිළිසඳරේ යෙදෙන ස්ථානය ද මෙනමින් හඳුන්වා ඇත. ගිමන් නිවාගැනීම සඳහා ද භාවිත ව ඇත.[60]), අග්ගිසාලා (ගිනිහල්ගෙය), කුටි (කිළිය), වච්චකුටි (වැසිකිළිය), චංකම (සක්මන), චංකමනසාලා (සක්මන් මලුව), උදපාන (ළිඳ), උදපානසාලා (ළිංහල), ජන්තාඝර (නානකොටුව), ජන්තාඝරසාලා (ජන්තාඝර ශාලාව), පොක්ඛරණී (පොකුණ), මණ්ඩප (මඩුව), ආරාම (ආරාමය), ආරාමවත්ථු (ආරාම වත්ත) යන අංග විහාරවලට එකතු කර ඇත.[61] එමෙන් ම විශාල විහාර ඉදිකළ පසු ඒවා ප්‍රාකාර ආදියෙන් වටකිරීම ද සම්ප්‍රදායයක් වූ බව පෙනේ.[62] මෙබඳු ම විස්තරයක් අනේපිඬු සිටුවරයා විසින් ජේතවනාරාමය ඉදිකළ ආකාරය සඳහන් කරමින් චුල්ලවග්ගපාළිය ඉදිරිපත් කර තිබේ.[63] එහි අතිරේක ව දක්වා ඇත්තේ කැසිකිළිය (පස්සාවකුටි) පමණි.

සේනාසන පිළිබඳ මෙබඳු ලක්ෂණ කථනයන් පමණක් නො ව සෙනසුන් ඉදිකිරීමේ තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් ද මූලාශ්‍රයන්හි තැනින් තැන තොරතුරු හමුවීම තත්කාලීන නිර්මාණ තාක්ෂණවේදය පිළිබඳ තොරතුරු ගවේෂකයෙකුට ඉතා වැදගත් ය. රජගහ නුවර සිටුවරයා විසින් මුලින් ම තනවන ලද විහාර සැට ප්‍රාථමික තාක්ෂණයක් භාවිතයෙන් නිමකරන ලද බව ඉහතදී ද දැක්වීමු. එහෙත් එම විහාරවල වාසය කරන විට ඇති වූ විවිධ බාධක නිසා සෙනසුන්හි ද විවිධ වෙනස්කම් සිදුකරන්නට බුදුරදුන් අනුදැන වදාරා ඇත.

සර්පාදීන් විහාරය තුළට පිවිසෙන හෙයින් දොරටුවක්[64] ද විහාරය තුළ උණුසුම මනා ව රඳවා ගැනීම සඳහා මනා පියස්සසක්[65] ද ප්‍රිය මනාපභාවය හා පිරිසිදු වාතය සඳහා වාකවුළුවක්[66] ද පහසුව හා දැකුම්කළුබව සඳහා වර්ණ ගැන්වීම[67] හා චිත්‍ර ඇඳීම[68] ද ජලය විහාරයට පිවිසීම වැළැක්වීම සඳහා උස් බිමක තැනීම[69] ද නැඟීමේ පහසුව සඳහා පඩිපෙළක්[70] හා අත්වැලක්[71] යෙදීම ද විහාරය තුළ භික්ෂූන්ගේ ආවරණය සඳහා කොට බිත්තියක් බැඳීම[72] හා කාමර වෙන්කිරීම[73] ද බුදුරදුන් විසින් අනුදැන වදාරා ඇත.

තත්කාලීන සෙනසුනක දොරටුවේ තාක්ෂණය පිළිබඳ කදිම විස්තරයක් සේනාසනක්ඛන්ධකයේ දී හමු වේ. දොරටුව දොරපළුව (කවාට), දොරබාව (පිට්ඨසංඝාට), වටෙවුලීය (උදුක්ඛලික), උත්තරලීය (උත්තරපාසක), අදිනා රැහැන (ආවිඤ්ජනරජ්ජු), රැහැන ලන සිදුර (ආවිඤ්ජනච්ඡිද්ද), අගුල් වැටිය (අග්ගලවට්ටික), අගුල් කණුව (කපිසීසක), යතුර (සූචික), තරංකය (ඝටික), කෙසිසිදුර (තාලච්ඡිද්ද) හා යතුරු ඉද්ද (යන්තිකං සූචිකං) යන ලක්ෂණවලින් යුතු වූ බව ඒ විස්තරයට අනුව පෙනේ.[74] යතුරු ද ලෝහ යතුරු (ලොහතාලං), ලී යතුරු (කට්ඨතාලං) හා අං යතුරු (විසාණතාලං) යනුවෙන් තෙවැදෑරුම් වේ.

මුලින් ම රජගහ සිටුවරයා විසින් තනවන ලද විහාරවල වහල සෙවිළි කර තිබුණේ තණවලිනි. එහෙත් ඝන දඬු යොදා පසු ව ඇතුළත පිටත බදාම ආලේප කොට වහල සකස් කිරීමට බුදුරදුන් විසින් අනුදැන වදාරා ඇත.[75] එහි ම තවත් තැනක විහාරය සෙවිළි කිරීම සඳහා භාවිත කළ හැකි ද්‍රව්‍ය පසක් දක්වා තිබේ.[76] එනම් උළු, ගල්, සුධා, තෘණ හා ගස්වල කොළ යන පස යි. වාකවුළු ද තුන් ආකාරයකින් නිර්මාණය කර ඇත.[77]

1. වෙදිකාවාතපානං - ස්තූපවල සතරැස් කොටුව වැනි ගඩොලින් තනන ලද වාකවුළුව
2. ජාලවාතපානං - දැල් වාකවුළුව
3. සලාකවාතපානං - කුරු සහිත වාකවුළුව



එමෙන් ම ආරක්ෂාව සඳහා වාකවුළුවකට රෙදි වෙළා කරන ලද පිස්නක් යෙදීම[78] ද ඊට පියනක් හෙවත් වසන පළුවක් එක්කිරීම ද බිස්සක් යෙදීම[79] ද සිදුකර ඇති බව පෙනේ. පඩිපෙළ ඉදිකිරීම සඳහා භාවිත කර ඇත්තේ ගඩොල්, ගල් හා දැව ය. මේ නිසා ඒවා ඉට්ඨකාසොපාණ, සිලාසොපාණ හා දාරුසොපාණ යනුවෙන් නම් කර තිබේ.[80] කාමර බැඳීමේ දී කුඩා විහාරවල එකත්පසෙක ද මහාවිහාරවල මධ්‍යයේ ද කාමර ඉදිකොට තිබේ.[81] එම කාමර ද ප්‍රමාණය හා හැඩය අනුව තෙවගකට බෙදා ඇත.[82]

1. සිවිකාගබ්භ - සිව්රැස් ගබ
2. නාළිකාගබ්භ - නැළි ගබ (පළලට වඩා දෙගුණයක් හෝ තුන්ගුණයක් දිග් වූ ගබ)
3. හම්මියගබ්භ - සඳලු ගබ (උඩ තට්ටුව කුළු ගෙයක් බඳු වූ හෝ මුදුන් පියස්සක් ඇති ගබ)

බිත්ති බැඳීමේ දී ලී විද එහි කණු සිටුවීම සිදුකර ඇත.[83] එය 'කුලුංකපාදකය' නමින් හඳුන්වා ඇත. එසේ සිදු කොට ඇත්තේ බිත්තියේ මුල දිරායෑම වළක්වා ගැනීම සඳහා ය. ඒ අතර බිත්තිය වැස්සෙන් තෙමී සෝදා යෑම වළක්වා ගැනීම සඳහා රැකවල් පැලැල්ලක් (පරිත්තානකිටිකං) යෙදීමත් වසුගොම අළු මැටි එකට මිශ්‍ර කොට සාදාගත් බදාමයක් (උද්දසුධං) බිත්තියේ ආලේප කිරීමත් සිදුකොට තිබේ.[84] තව ද මැටියෙන් බිත්ති බැඳ ඉදිකරන ලද කුටි මනා ව පිරිමැද ඇතුළත පිටත තණකොළ, කොළරොඩු ආදිය පුරවා පුළුස්සා ගත් බවට ද සාධක ඇත.[85] ඉන් පෙනී යන්නේ ශක්තිමත්භාවය සඳහා පිළිස්සීම සිදුකර ඇති බව යි. විහාරයේ සැලසුම ද කාමර බෙදීමට පමණක් සීමා නොවී ය. විහාරයේ ඉදිරිපස පිලක් ද දොරටුව දෙපස බිත්ති බැඳීමෙන් තනන ලද ආලින්දයක් ද පිලක් නොමැති විහාරයෙහි වටමාලයක් ද විහාරය වටේ ආවරණය සඳහා පිටතට පැන්නූ වහලක්[86] ද පිලෙහි ආවරණය සඳහා අකුලන පැලැල්ලක්[87] හා ඔසොවන පැලැල්ලක් ද සකසා තිබී ඇත.

පිරියම් කිරීමේ දී බිත්තිවල සුදු පැහැය හා ගුරු පැහැය ද බිම කලු පැහැය ද යොදා තිබේ. බිත්තිවල සුදු පිරියම් කිරීමේ දී දහයියා පිඬු දී අත්ලෙන් තුනී කිරීම, සියුම් මැටි යොදා අත්ලෙන් තුනී කිරීම හා මැලියම් හා පිටි කැඳ යෙදීම සිදුකර තිබේ. ගුරු පිරියම් කිරීමේ දී දහයියා පිඬු දී අත්ලෙන් තුනී කිරීම, කුඩුමසු මැටි ගා අත්ලෙන් තුනී කිරීම හා අබ පිටි හා ඉටිතෙල් (ඉටි දියර) යෙදීම සිදුකර ඇති අතර තැන් තැන්වල බින්දු බින්දු වශයෙන් උස් ව නැගෙන විට ඒවා රෙදිකඩකින් පිසදමා ඇත. දහයියා පිඬු දී අත්ලෙන් තුනී කිරීම, ගැඩවිලි පස් යොදා අත්ලෙන් තුනී කිරීම හා නෙල්ලි හා කසට යෙදීම යන ක්‍රම බිම කළු පැහැ ගැන්වීමේ දී භාවිත කොට ඇත.[88] සිතුවම් කිරීමේ දී මාලාකර්ම, ලතාකර්ම, මකරදන්තකාදිය ඇඳ ඇති අතර පස්වණක් පැහැ කිරීම ද සිදුකර තිබේ.[89]

මින් අනතුරුව අවධානය යොමු කළ යුත්තේ සෙනසුන්හි භූදර්ශන වාස්තු ශිල්පය පිළිබඳව යි. මලුව සැකසීමේ පටන් එය විසිතුරු කිරීම දක්වා වූ කිසියම් භූදර්ශන තාක්ෂණවේදයක් ද මුල් යුගයේ පටන් භාවිත වූ බවට මූලාශ්‍රයාගත සාධක අපට හමු වේ. පළමු ව පාංශුබාදනය වැළැක්වීම සඳහා බැමි බැඳීමට නියම කර තිබේ. එය ද ගඩොලින් හෝ ගලින් හෝ දැවයෙන් බැඳිය හැකි ය.[90] එමෙන් ම පොළොව මඩ වීම වැළැක්වීම සඳහා බොරළු යෙදීමටත්[91] ගල් පුවරු බහාලීමටත්[92] අනුදැන වදාරා ඇත. එපමණක් නො ව මලුවේ එක්වන වතුර බැස යාම සඳහා සොරොව්වක් ද නිර්මාණය කොට ඇත.[93] විසිතුරු බව ඇති කිරීම සඳහා මලුවෙහි මල්පැළ පවා රෝපණය කර තිබූ බව සතුන් විසින් ඒවා පෙළන්නේ යැයි සේනාසනක්ඛන්ධකයෙහි දක්වා තිබීමෙන් පැහැදිලි වේ.[94] එනිසා සතුන්ට විහාර පරිශ්‍රයට ඇතුළුවීමට නො හැකි වන ලෙස උණ වැට, වැටකේ වැට හා අගල යන තෙවැදෑරුම් වැට ඉදිකරනු ලැබුණි.[95] අනතුරුව කොටුවක් ද හිඳිකඩක් ද දෙබෑ දොරපළුවක් ද තොරණක් ද රෝද කඩුල්ලක් ද ඉදිකර තිබේ.[96]

මෙනයින් සලකා බැලීමේ දී පැහැදිලි වන්නේ මුල් ම යුගයේ භික්ෂූන් වහන්සේ විසින් රුක් මුල්, පිදුරු ගොඩවල්, සුසාන, කන්දර වැනි ස්ථාන සෙනසුන් ලෙස භාවිත කර ඇති නමුත් බුදුසමයේ ව්‍යාප්තියත් සමඟ විශාල දායක පිරිසක් ඇතිවීම හා භික්ෂු ප්‍රජාව විශාල වීම නිසා බුදුසමයේ දියුණුව වෙනුවෙන් විවිධාකාරයේ සේනාසන ශාසනයට පුදන ලද බව යි. එමෙන් ම භික්ෂූන්ගේ මූලික අභිමතාර්ථයට පටහැනි නොවන අයුරින් ඒවා පිළිගැනීමටත් පරිභෝග කිරීමටත් බුදුරදුන් අනුදැන වදාරා ඇති බව යි. මුල් අවස්ථාවේ පරිභෝග කරන ලද්දේ ඉතා සරල, ප්‍රාථමික මට්ටමේ සෙනසුන් වන නමුත් ක්‍රමයෙන් සංකීර්ණ භික්ෂු ආරාම දක්වා ඒවා සංවර්ධනය වී ඇත. පශ්චාත්කාලීන ව සංවර්ධනය වූ ත්‍රිපිටක හා විවරණ ග්‍රන්ථවල වර්ණනාත්මක ස්වරූපයෙන් සෙනසුන් පිළිබඳ ව කවර විස්තර ඉදිරිපත් කර ඇතත්[97] වේළුවනාරාමය, මිගාරමාතුප්‍රාසාදය, ජේතවනාරාමය, නිග්‍රෝධාරාමය ආදි සෙනසුන් මහා පරිමාණයේ විහාර සංකීර්ණ වුව ද හුදෙක් භික්ෂූන්ගේ මූලික අවශ්‍යතා පමණක් ඉටුකරන, නමුත් ඉතා දියුණු ඉදිකිරීම් ක්‍රම ශිල්ප භාවිත නොකර ඉදිකරන ලද සෙනසුන් විය යුතු බව පෙනේ. මූලාශ්‍රයාගත තොරතුරුවලට අනුව විහාර, අඩ්ඪයෝග, ප්‍රාසාද, හම්මිය බඳු සෙනසුන් භික්ෂූන් භාවිත කොට ඇත්තේ ඉතා විරල වශයෙන් බව පෙනේ. නගරාශ්‍රිත ව ජීවත් වූ භික්ෂූන් එබඳු විහාර භාවිත කළ ද අතිශය විශාල පිරිසක් විසින් භාවිත කරන ලද්දේ කුටි, කුටික, ලෙන්, ගුහා, අට්ට ආදි සරල සේනාසන ය. තරමක් විශාල විහාරයන් විශේෂ ඉදිකිරීම් වන නමුත් සුළු පරිමාණයේ විහාරයන් සියල්ල ම ස්වාභාවික පිහිටීම් ඇසුරු කරගෙන සුළු වෙනස්කම් කිහිපයක් සිදුකරමින් නිමවා තිබේ. කෙසේ වුව ද තත්කාලීන ගෘහනිර්මාණ ලක්ෂණ හා ඉදිකිරීම් තාක්ෂණික ක්‍රමවේදය හඳුනාගැනීම සම්බන්ධයෙන් ද මෙම තොරතුරු අතිශයින් වැදගත් ය. මහා පරිමාණ විහාර සංකීර්ණ පිළිබඳ තොරතුරු නොසලකා හළ විට අනෙකුත් තොරතුරුවලින් ගම්‍ය වන්නේ තත්කාලීන සාමාන්‍ය ජනයා විසින් ස්වකීය වාසස්ථාන නිර්මාණය කරගැනීමෙහිලා භාවිත කරන ලද කිසියම් ශිල්පීය උපක්‍රම විශේෂයක් සේ සැලකීම අනුචිත නො වේ. ඉදිකිරීම් ක්‍රම ශිල්පය අතිශයින් දියුණු නොවූත් වර්ණ ධුරාවලියක් යටතේ සමාජ ස්ථරායනය සැකසී තිබූත් එබඳු වකවානුවක සාමාන්‍ය

ජනයාගේ වාසස්ථාන ඉදිකිරීම හා භාවිතය පිළිබඳ ව කිසියම් ඉංගිතයක් ලබා ගැනීමට ද එමගින් ඉඩ හසර විවර වේ. ඒ නිසා ත්‍රිපිටකය හා තදනුබද්ධ විවරණ ඇසුරෙන් අප ලබන සාක්ෂ්‍යයන් භික්ෂු සෙනසුන් පිළිබඳ ව මෙන් ම තත්කාලීන ඉදිකිරීම් ක්‍රමෝපායයන් පිළිබඳ ව ද නිරවුල් සිතුවමක් මවා ගැනීමට බෙහෙවින් උපස්ථම්භක වන්නේ යැයි සැලකීම යුක්ති යුක්ත ය.

## ආන්තික සටහන්

1. ''රුක්ඛමූලසෙනාසනං නිස්සාය පබ්බජ්ජා. තත්ථ සො යාවජීවං උස්සාහො කරණීයො. අතිරෙකලාභො විහාරො අඩ්ඪයොගො පාසාදො හම්මියං ගුහාති.''
මහාවග්ගපාළි I, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005 පි.238
2. ''තෙ ච භික්ඛූ තහං තහං විහරන්ති අරඤ්ඤෙ රුක්ඛමූලෙ පබ්බතෙ කන්දරායං ගිරිගුහායං සුසානෙ වනපත්ථෙ අජ්ඣොකාසෙ පලාලපුඤ්ජෙ''
චුල්ලවග්ගපාළි II, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005 පි.128
3. ''අනුජානාමි භික්ඛවෙ පඤ්චලෙනානි, විහාරං අඩ්ඪයොගං පාසාදං හම්මියං ගුහාති.'' - එම - පි.128
4. ''අථ ඛො රාජගහකො සෙට්ඨී එකාහෙනෙව සට්ඨී විහාරෙ පතිට්ඨාපෙසි.'' - එම - පි.128
5. මෙය සයන යන්නෙහි සංකෝචනයකි. (සයන > සෙන) ජයති > ජෙති, නයති > නෙති ආදිය ද ඊට උදාහරණ වශයෙන් දැක්විය හැකි ය.
6. ''සෙනාසනෙනා'ති සයනෙන ආසනෙන ච. යත්ථ යත්ථ හි මඤ්චාදිකෙ විහාරාදිකෙ ච සෙති, තං සෙනං. යත්ථ යත්ථ පීඨාදිකෙ ආසති, තං ආසනං. තදුභයං එකතො කත්වා 'සෙනාසනන්ති' වුත්තං.''
දීඝනිකායටීකා, (සංස්.) හේනේගෙම කල්‍යාණසිරි හිමි හා හේනේගොඩ කල්‍යාණධම්ම හිමි, අනුල මුද්‍රණාලය, කොළඹ, 1967, පි.705
7. ''තත්ථ සෙනාසනන්ති මඤ්චො පීඨං භිසි බිම්බොහනං විහාරො අඩ්ඪයොගො පාසාදො හම්මියං ගුහා ලෙණං අට්ටො මාලො වෙලුගුම්බො රුක්ඛමූලං. යත්ථ වා පන භික්ඛූ පටික්කමන්තී'ති ඉමානි පණ්ණරසසෙනාසනානි.''
සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථා, (සංස්.) හෙයියන්තුඩුවේ ධම්මකිත්ති හිමි, හේවාවිතාරණ පුනර්මුද්‍රණය, 2006, පි.744, මනොරථපූරණී නාම අංගුත්තරනිකායට්ඨකථා, (සංස්.) ධම්මකිත්ති ශ්‍රී



ධම්මානන්ද හිමි, හේවාවිතාරණ පුනර්මුද්‍රණය, 2007, පි.493, චුල්ලනිද්දෙසට්ඨකථා, (සංස්.) බෝරුග්ගමුවේ ශ්‍රී රේවත හිමි, හේවාවිතාරණ පුනර් මුද්‍රණය, 2007, පි.89

8. ''චතුබ්බිධඤ්හි සෙනාසනං විහාරසෙනාසනං මඤ්චපීඨසෙනාසනං සන්ථතසෙනාසනං ඔකාසසෙනාසනන්ති. තත්ථ මඤ්චො'පි සෙනාසනං. පීඨම්පි සෙනාසනං. භිසිපි බිම්බොහනම්පි විහාරොපි අඩ්ඪයොගොපි පාසාදොපි හම්මියම්පි ගුහාපි අට්ටොපි මාළොපි ලෙණම්පි වෙළුගුම්බොපි රුක්ඛමූලම්පි මණ්ඩපොපි සෙනාසනං. යත්ථ වා පන භික්ඛු පටික්කමන්ති සබ්බමෙතං සෙනාසනන්ති. වචනතො විහාරො අඩ්ඪයොගො පාසාදො හම්මියං ගුහාති ඉදං විහාරසෙනාසනං නාම. මඤ්චො පීඨං භිසි බිම්බොහනන්ති ඉදං මඤ්චපීඨසෙනාසනං නාම. චිමිලිකා චම්මඛණ්ඩො තිණසන්ථාරොති ඉදං සන්ථතසෙනාසනං නාම. යත්ථ වා පන භික්ඛූ පටික්කමන්තීති ඉදං ඔකාසසෙනාසනං නාම.''
සාරත්ථදීපනීටීකා (සා.දී.ටී.), සෙනාසනක්ඛන්ධක, විහාරානුජානනකථාවණ්ණනා, CSCD, Vipassana Research Iititute, Dhammagiri, Igatpuri, 1999 vri-3.357
9. ''තෙහි සම්මතෙහි භික්ඛූහි සෙනාසනං සල්ලක්ඛෙතබ්බං, චෙතියඝරං බොධිඝරං ආසනඝරං සම්මුඤ්ජනිඅට්ටො දාරුඅට්ටො වච්චකුටි ඉට්ඨකසාලා වඩ්ඪකීසාලා ද්වාරකොට්ඨකො පානීයමාළො මග්ගො පොක්ඛරිණීති එතානි හි අසෙනාසනානි. විහාරො අඩ්ඪයොගො පාසාදො හම්මියං ගුහා මණ්ඩපො රුක්ඛමූලං වෙළුගුම්බොති ඉමානි සෙනාසනානි.''
සමන්තපාසාදිකා, (සංස්.) බද්දේගම පියරතන හිමි හා වැලිවිටියේ සෝරත හිමි, හේවාවිතාරණ පුනර්මුද්‍රණය, 2006, පි.907
10. ''සීතං උණ්හං පටිහන්ති තතො වාළමිගානි ච
සිරිංසපෙ ච මකසෙ සිසිරෙ චාපි වුට්ඨියො
තතො වාතාතාපො ඝොරො සඤ්ජාතො පටිහඤ්ඤති
ලෙනත්ථඤ්ච සුඛත්ථඤ්ච ඣායිතුඤ්ච විපස්සිතුං

දදෙය්‍ය උජුභූතෙසු විප්පසන්නෙන චෙතසා
තෙ තස්ස ධම්මං දෙසෙන්ති සබ්බදුක්ඛාපනූදනං''
චුල්ලවග්ගපාළි II, 2005 පි.130,132
11. ''අනුජානාමි භික්ඛවෙ පඤ්චලෙනානි, විහාරං අඩ්ඪයොගං පාසාදං හම්මියං ගුහාති.'' - එම - පි.128
12. ''අගාරන්ති විහාරො අඩ්ඪයොගො පාසාදො හම්මියං ගුහා.''
පටිසම්භිදාමග්ගප්පකරණ I, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005 පි.332

13. ''විහාරො පාකාරපරිච්ඡින්නො සකලො ආවාසො. ---- විහාරො නාම දීඝමුඛපාසාදො.''
   දීඝනිකායටීකා, 1967, පි.183, 705

14. ''අඩ්ඪයොගොති දීඝපාසාදො. ගරුළසණ්ඨාපනපාසාදොතිපි වදන්ති. --- අඩ්ඪයොගො එකපස්සච්ඡදනකසෙනාසනං. තස්ස කිර එකපස්සෙ භිත්ති උච්චතරා හොති. ඉතරපස්සෙ නීචා. තෙන එකපස්සච්ඡදනකං හොති.'' - එම - පි.183, 705

15. ''අඩ්ඪයොගො'ති නිකුණ්ඩගෙහො.''
   මහානිද්දෙසට්ඨකථා, (සංස්.) බෝගහගම සිරි රේවත හිමි, හේවාවිතාරණ පුනර්මුද්‍රණය, 2006, පි.139

16. ''--- පසාදං සොමනස්සං ජනෙති උප්පාදෙතී'ති පාසාදො.''
   අපදානට්ඨකථා, (සංස්.) වෙලගෙදර සෝමාලෝක හිමි, හේවාවිතාරණ පුනර්මුද්‍රණය, 2006, පි.364

17. ''පාසාදොති චතුරස්සපාසාදො. --- පාසාදො නාම ආයතචතුරස්සපාසාදො.''
   දීඝනිකායටීකා, 1967, පි.183, 705

18. ''මුණ්ඩකච්ඡදනපාසාදොති චන්දිකංගණයුත්තො පාසාදො.''
   සාරත්ථදීපනීටීකා, නිස්සග්ගියඛණ්ඩ, උදොසිතසික්ඛාපදවණ්ණනා, CSCD, 1999 vri-2.348

19. ''තාය කාරිතො සහස්සගබ්භො පාසාදො මිගාරමාතුපාසාදො නාම.''
   මනෝරථපූරණී නාම අංගුත්තරනිකායට්ඨකථා, 2007, පි.313

20. ''තාය මිගාරමාතුයා නවකොටි අග්ඝනකං මහාලතාපිලන්ධනං විස්සජ්ජෙත්වා කාරාපිතො පාසාදො හෙට්ඨා ච උපරි ච පඤ්ච පඤ්ච ගබ්භසතානි කත්වා සහස්සකූටාගාරගබ්භො. සො මිගාරමාතුපාසාදො'ති වුච්චති.''
   සුත්තනිපාතට්ඨකථා, (සංස්.) සූරියගොඩ සුමංගල හිමි හා මාපලගම චන්දජෝති හිමි, හේවාවිතාරණ පුනර්මුද්‍රණය, 2007, පි.407

21. ''සා සුද්ධපාසාදො'ව න සොභතීති තං පරිවාරෙත්වා පඤ්චදුවඩ්ඪගෙහසතානි පඤ්චචූලපාසාදසතානි පඤ්චදීඝසාලාසතානි ච කාරාපෙසි.''
   සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථා, 2006, පි.623

22. ''පාසාදො'ති පසාදං සොමනස්සං ජනෙති උප්පාදෙතී'ති පාසාදො. මාලාකම්මචිත්තකම්මසුවණ්ණකම්මාද්‍යනෙකවිචිත්තං දිස්වා තත්ථ පවිට්ඨානං ජනානං පසාදං ජනයතී'ති අත්ථො.''
   අපදානට්ඨකථා, 2006, පි.364

23. ''තෙන ඛො පන සමයෙන විසාඛා මිගාරමාතා සංඝස්ස අත්ථාය සාලින්දං පාසාදං කාරාපෙතුකාමා හොති හත්ථිනඛකං, ---''
   චූල්ලවග්ගපාළි, II, 2005 පි.200



24. ''අනුජානාමි භික්ඛවෙ සබ්බං පාසාදපරිභොගං.'' - එම - පි.200

25. ''හම්මියං මුණ්ඩච්ඡදනපාසාදො. --- හම්මියං මුණ්ඩච්ඡදනකං චන්දිකංගණයුත්තං.''
   දීඝනිකායටීකා, 1967, පි.183, 705

26. ''ගුහා නාම කෙවලපබ්බතගුහා.'' - එම - පි.183, 705

27. ''ගුහායා'ති පංසුගුහාය.''
   මහානිද්දෙසට්ඨකථා, 2006, පි.139

28. ''ගුහම්පි ඉට්ඨකාගුහං වා සිලාගුහං වා දාරුගුහං වා භූමිගුහං වා මහන්තස්ස කරොන්තස්ස අනාපත්ති.''
   සමන්තපාසාදිකා, (සංස්.) යූ.පී. ඒකනායක, සිරි භාරති යන්ත්‍රාලය, කොළඹ, 1915, පි.317

29. ''ගුහාති පංසුගුහා පාසාණගුහා මිස්සකගුහාති තිස්සො ගුහා. තත්ථ පංසුගුහා උදකමුත්තට්ඨානෙ අහොසි.''
   මජ්ඣිමනිකායටීකා, පරිබ්බාජකවග්ග, සන්දකසුත්තවණ්ණනා, CSCD, 1999 vri-2.107

30. ''අට්ටො පටිරාජූනං පටිබාහනයොග්ගො චතුපඤ්චභූමකො පතිස්සයවිසෙසො.''
   දීඝනිකායටීකා, 1967, පි.183, 705

31. ''අට්ටො බහලභිත්තිකං ගෙහං යස්ස ගොපානසියො අග්ගහෙත්වා ඉට්ඨකාහි එව ඡදනං හොති. අට්ටානකාකාරෙන කරීයතිපි වදන්ති.''
   එම - පි.705

32. ''අට්ටා'ති ද්වාරට්ටාලකා.''
   මහානිද්දෙසට්ඨකථා, 2006, පි.139

33. ''ලෙණන්ති ලීයන්තෙ නිලීයන්තෙ සත්තා එත්ථාති ලෙණං විහාරං.''
   අපදානට්ඨකථා, 2006, පි.408

34. ''ලෙණං ද්වාරබද්ධං පබ්භාරං.''
   දීඝනිකායටීකා, 1967, පි.183
   ''ලෙණං ද්වාරබන්ධං.'' - එම - පි.705

35. පාලි - සිංහල අකාරාදිය, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 1998 පි.308

36. ''ලෙනා'ති මරියාදාඡින්නා අච්ඡිද්දා පබ්බතලෙණා.''
   මහානිද්දෙසට්ඨකථා, 2006, පි.139

37. ''සිලුච්චයලෙණන්ති සිලුච්චයෙ ලෙණං. පබ්බතගුහාති අත්ථො.''
   සාරත්ථදීපනීටීකා, පාචිත්තියකණ්ඩ, දුතියසෙනාසනසික්ඛාපදවණ්ණනා, CSCD, 1999 vri-3.26

38. "අථ නං කුට්ටෙහි පරික්ඛිපිත්වා ද්වාරවාතපානානි යොජෙත්වා සුපරිනිට්ඨිතසුධාකම්මමාලාකම්මචිත්තං ලෙණං කත්වා භගවතො අදංසු."
සුමංගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථා, 2006, පි.497

39. "--- සමන්තතො පංසුං අපනෙත්වා ලෙණං සොධෙත්වා කුට්ටපරික්ඛෙපං කත්වා ද්වාරවාතපානං යොජෙත්වා සුපරිනිට්ඨිතසුධාකම්මචිත්තකම්මරජතපට්ටසදිසාය වාලුකාය සන්ථත පරිවෙණං ලෙණං කත්වා මඤ්චපීඨං පඤ්ඤපෙත්වා --- ලෙණං ගම්භීරං අහොසි ඔතරිත්වා අභිරුහිතබ්බං."
පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨකථා III, (සංස්.) ධම්මකිත්ති ශ්‍රී ධම්මානන්ද හිමි, හේවාවිතාරණ පුනර්මුද්‍රණය, (වර්ෂය සඳහන් වී නැත.) පි.139

40. "තත්ථ නිපන්නානං රත්තිභාගෙ කූටාගාරමන්තො පාසාණො පවට්ටමානො ආගන්ත්වා ලෙණද්වාරං පිදහි."
ධම්මපදට්ඨකථා, ප්‍රථම භාගය, (සංස්.) කහවේ රතනසාර හිමි, හේවාවිතාරණ පුනර්මුද්‍රණය, (වර්ෂය සඳහන් වී නැත.) පි.362

41. "අනාපත්ති ලෙණෙති ආදිසු ලෙණං මහන්තම්පි කරොන්තස්ස අනාපත්ති."
සමන්තපාසාදිකා, 2006, පි.411

42. "මාලො එකකූටසංගහිතො අනෙකකොණො පතිස්සයවිසෙසො. වට්ටාකාරෙන කතසෙනාසනන්ති කෙචි."
දීඝනිකායටීකා, 1967, පි.705
"මාලා'ති වට්ටගෙහා."
මහානිද්දෙසට්ඨකථා, 2006, පි.139

43. "කූටාගාරං ද්වීහි කණ්ණිකාහි කත්තබ්බපාසාදො. --- කූටාගාරං යො කොචි කණ්ණිකාබද්ධපාසාදො."
විසුද්ධිමග්ගමහාටීකා, සීලනිද්දෙසවණ්ණනා, ආජීවපාරිසුද්ධිසීලවණ්ණනා, CSCD, 1999 vri-1.49

44. "කූටාගාරන්ති එකකණ්ණිකං ගාහාපෙත්වා කතං අගාරං. කූටාගාරසාලාති ද්වෙ කණ්ණිකෙ ගහෙත්වා කතසාලා."
සාරත්ථප්පකාසිනී නාම සංයුත්තනිකායට්ඨකථා, (සංස්.) විදුරුපොල පියතිස්ස හිමි, හේවාවිතාරණ පුනර්මුද්‍රණය, 2007, පි.86

45. "තත්ථ නිපන්නානං රත්තිභාගෙ කූටාගාරමන්තො පාසාණො පවට්ටමානො ආගන්ත්වා ලෙණද්වාරං පිදහි."
ධම්මපදට්ඨකථා, ප්‍රථම භාගය, පි.362

46. "උද්දණ්ඩො අගබ්භිකා එකද්වාරා දීඝසාලාති වදන්ති."
විසුද්ධිමග්ගමහාටීකා, සීලනිද්දෙසවණ්ණනා, ආජීවපාරිසුද්ධිසීලවණ්ණනා, CSCD, 1999 vri-1.49



47. "උද්දණ්ඩො නාම එකො පතිස්සයවිසෙසො. තිඡදනගෙහො'තිපි එකෙ."
මහානිද්දෙසට්ඨකථා, 2006, පි.139-140

48. "කුටියාදි උල්ලිත්තාදිකුටියා." - එම - පි.139

49. "කුටි නාම උල්ලිත්තා වා හොති අවලිත්තා වා උල්ලිත්තාවලිත්තා වා."
සමන්තපාසාදිකා, 1915, පි.317

50. "තෙ තාවදෙව අරඤ්ඤං පවිසිත්වා දබ්බසම්භාරෙ සමොධානෙත්වා සතං සතං හුත්වා එකෙකං කුටිං චංකමනාදිපරිවාරං කත්වා මඤ්චපීඨපානීයපරිභොජනීයානි ඨපෙත්වා ---"
මනෝරථපූරණී නාම අංගුත්තරනිකායට්ඨකථා, 2007, පි.185

51. "දණ්ඩකෙහි කුටිකං කත්වා ඡදනත්ථාය තිණං ආහරිස්සාමීති එකස්මිං මහාවම්මිකපාදෙ තිණං ඡින්දති." - එම - පි.195

52. "කුටිකං කත්වා මඤ්චකං පඤ්ඤපෙත්වා --- ථෙරියා ආගන්ත්වා කුටිකං පවිසිත්වා ද්වාරං පිධාය මඤ්චකෙ නිසින්නමත්තාය ---"
ධම්මපදට්ඨකථා, ප්‍රථම භාගය, පි.238

53. "සො වයප්පත්තො --- ගංගාතීරෙ තීහි තාලපත්තෙහි කුටිකං කත්වා විහාසි."
ථෙරගාථට්ඨකථා, දුක නිපාත, ගංගාතීරියත්ථෙරගාථාවණ්ණනා, CSCD, 1999 vri-1.269

54. "අථ ඛො ආයස්මා ධනියො කුම්භකාරපුත්තො සාමං චික්ඛල්ලං මද්දිත්වා සබ්බමත්තිකාමයං කුටිකං කරිත්වා තිණඤ්ච කට්ඨඤ්ච ගොමයඤ්ච සංකඩ්ඪිත්වා තං කුටිකං පචි. සා අහොසි කුටිකා අභිරූපා දස්සනීයා පාසාදිකා ලොහිතිකා. සෙය්‍යථාපි ඉන්දගොපකා සෙය්‍යථාපි නාම කිංකිණිකසද්දො එවමෙව තස්සා කුටිකාය සද්දො අහොසි."
පාරාජිකපාළි, පාරාජිකකණ්ඩ, දුතිය පාරාජිකං, CSCD, 1999 vri-.48

55. "තිණකුටිකායා'ති සත්තභූමිකො'පි පාසාදො තිණපණ්ණච්ඡදනා තිණකුටිකා'ති වුච්චති."
සමන්තපාසාදිකා, 2006, පි.411

56. "මහන්තස්ස පන රුක්ඛසුසිරස්ස අන්තො පදරච්ඡදනං කුටිකං කත්වා පවිසනද්වාරං යොජෙත්වා උපගන්තුං වට්ටති. රුක්ඛං ඡින්දිත්වා ඛාණුමත්ථකෙ පදරච්ඡදනං කුටිකං කත්වාපි වට්ටතියෙව. --- මහාවිටපෙ පන අට්ටකං බන්ධිත්වා තත්ථ පදරච්ඡදනං කුටිකං කත්වා උපගන්තබ්බං. --- සුසානෙ පන අඤ්ඤං කුටිකං කත්වා උපගන්තුං වට්ටති. --- එත්ථාපි චතුසු ථම්භෙසු ඡත්තං ඨපෙත්වා ආවරණං කත්වා ද්වාරං යොජෙත්වා උපගන්තුං වට්ටති. ඡත්තකුටිකා නාමෙසා හොති. චාටියාති එත්ථාපි මහන්තෙන කපල්ලෙන ඡත්තෙ වුත්තනයෙන කුටිං කත්වා උපගන්තුං වට්ටති."
එම - පි.799

57. "නළාගාරං කරිත්වාන තිණෙන ඡාදයිං අහං."
<u>අපදානපාළි,</u> 2005, 3105 පද්‍යය
"--- නළෙහි කතං අගාරං ---"
<u>ථෙරගාථට්ඨකථා,</u> දුක නිපාත, අභිභූතත්ථෙරගාථාවණ්ණනා, CSCD, 1999 vri-1.407

58. "උච්ඡාගාරං තිණාගාරං වත්ථාගාරඤ්ච යො දදෙ
තිණ්ණං අඤ්ඤතරං දත්වා සුධම්මං උපපජ්ජති"
<u>විමානවත්ථු,</u> බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර්මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2005, පි.148

59. "තස්මිං අම්බවනෙ රත්තිට්ඨානදිවාට්ඨානලෙණකුටිමණ්ඩපාදිනි සම්පාදෙත්වා භගවතො අනුච්ඡවිකං ගන්ධකුටිං කාරාපෙත්වා ---"
<u>පපඤ්චසූදනී නාම මජ්ඣිමනිකායට්ඨකථා III,</u> පි.31

60. "උපට්ඨානසාලා නාම පයිරුපාසනසාලා. යත්ථ උපට්ඨානමත්තං කරොන්ති න එකරත්තදිරත්තාදිවසෙන නිසීදනං. ඉධ පන තථා කතා නිසීදනසාලායෙවාති දස්සෙති."
<u>සීලක්ඛන්ධවග්ග අභිනවටීකා,</u> බ්‍රහ්මජාලසුත්තවණ්ණනා, CSCD, 1999 vri-1.172

61. "ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස විහාරො කාරාපිතො හොති. සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය 'ආගච්ඡන්තු භදන්තා, ඉච්ඡාමි දානඤ්ච දාතුං, ධම්මඤ්ච සොතුං, භික්ඛූ ච පස්සිතුන්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන පහිතෙ. න ත්වෙව අප්පහිතෙ, සත්තාහ සන්නිවත්තො කාතබ්බො." ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස අඩ්ඪයොගො කාරාපිතො හොති. -- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස පාසාදො කාරාපිතො හොති. --- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස හම්මියං කාරාපිතං හොති. ---- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස ගුහා කාරාපිතා හොති. ----- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස පරිවෙණං කාරාපිතං හොති. --- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස කොට්ඨකො කාරාපිතො හොති. ---- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස උපට්ඨානසාලා කාරාපිතා හොති. --- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස අග්ගිසාලා කාරාපිතා හොති. --- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස කප්පියකුටි කාරාපිතා හොති. --- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස වච්චකුටි කාරාපිතා හොති. --- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස චංකමො කාරාපිතො හොති. --- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස චංකමනසාලා කාරාපිතො හොති. --- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස උදපානො කාරාපිතො හොති. ---- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස උදපානසාලා කාරාපිතා හොති. --- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස ජන්තාඝරං කාරාපිතං



හොති. --- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස ජන්තාඝරසාලා කාරාපිතා හොති. --- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස පොක්ඛරණී කාරාපිතා හොති. --- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස මණ්ඩපො කාරාපිතො හොති. --- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස ආරාමො කාරාපිතො හොති. --- ඉධ පන භික්ඛවෙ උපාසකෙන සංඝං උද්දිස්ස ආරාමවත්ථු කාරාපිතං හොති. --- සො චෙ භික්ඛූනං සන්තිකෙ දූතං පහිණෙය්‍ය 'ආගච්ඡන්තු භදන්තා, ඉච්ඡාමි දානඤ්ච දාතුං, ධම්මඤ්ච සොතුං, භික්ඛූ ච පස්සිතුන්ති. ගන්තබ්බං භික්ඛවෙ, සත්තාහකරණීයෙන පහිතෙ. න ත්වෙව අප්පහිතෙ, සත්තාහ සන්නිවත්තො කාතබ්බො."
<u>මහාවග්ගපාළි,</u> 2005, පි.250-252

62. "--- අම්බවනං අට්ඨාරසහත්ථුබ්බෙධෙන තම්බපට්ටවණ්ණෙන පාකාරෙන පරික්ඛිපාපෙත්වා ---"
"--- අත්තනො අම්බවනෙ සත්ථුවසනානුච්ඡවිකං ගන්ධකුටිං භික්ඛුසංඝස්ස ච රත්තිට්ඨානදිවාට්ඨානඋපට්ඨානසාලා-කුටිමණ්ඩපචංකමනාදිකෙ ච සම්පාදෙත්වා පාකාරපරික්ඛිත්තං ද්වාරකොට්ඨකයුත්තං විහාරං කත්වා ---"
<u>උදානට්ඨකථා,</u> (සංස්.) බිහල්පොත දේවරක්ඛිත හිමි, හේවාවිතාරණ පුනර්මුද්‍රණය, (වර්ෂය සඳහන් වී නැත.) පි.265

63. "අථ බො අනාථපිණ්ඩිකො ගහපති ජෙතවනෙ විහාරෙ කාරාපෙසි. පරිවෙනානි කාරාපෙසි. කොට්ඨකෙ කාරාපෙසි. උපට්ඨානසාලායො කාරාපෙසි. අග්ගිසාලායො කාරාපෙසි. කප්පියකුටියො කාරාපෙසි. වච්චකුටියො කාරාපෙසි. පස්සාවකුටියො කාරාපෙසි. චංකමෙ කාරාපෙසි. චංකමනසාලායො කාරාපෙසි. උදපානෙ කාරාපෙසි. උදපානසාලායො කාරාපෙසි. ජන්තාඝරෙ කාරාපෙසි. ජන්තාඝරසාලායො කාරාපෙසි. පොක්ඛරණියො කාරාපෙසි. මණ්ඩපෙ කාරාපෙසි."
<u>චුල්ලවග්ගපාළි, II,</u> 2005 පි.168

64. "අනුජානාමි භික්ඛවෙ කවාටං" - එම - පි.132

65. "අනුජානාමි භික්ඛවෙ ඔගුම්බෙත්වා උල්ලිත්තාවලිත්තං කාතුං"
එම - පි.134

66. "අනුජානාමි භික්ඛවෙ තීණි වාතාපානානි, වෙදිකාවාතපානං ජාලවාතපානං සලාකවාතපානං"
එම - පි.134

67. "අනුජානාමි භික්ඛවෙ විහාරෙ සෙතවණ්ණං කාළවණ්ණං ගෙරුකපරිකම්මං"
එම - පි.142

68. "අනුජානාමි භික්ඛවෙ මාලාකම්මං ලතාකම්මං මකරදන්තකං පඤ්චපටිකං"
එම - පි.144

69. "අනුජානාමි භික්ඛවෙ උච්චවත්ථුකං කාතුං" - එම - පි.146

70. "අනුජානාමි භික්ඛවෙ තයො සොපාණෙ, ඉට්ඨකාසොපාණං සිලාසොපාණං දාරුසොපාණං"
එම - පි.146

71. "අනුජානාමි භික්ඛවෙ ආලම්බනබාහනං" - එම - පි.146

72. "අනුජානාමි භික්ඛවෙ අඩ්ඪකුඩ්ඩකං" - එම - පි.146

73. "අනුජානාමි භික්ඛවෙ තයො ගබ්භෙ, සිවිකාගබ්භං නාළිකාගබ්භං හම්මියගබ්භං"
එම - පි.146

74. - එම - පි.132

75. "අනුජානාමි භික්ඛවෙ ඔගුම්බෙත්වා උල්ලිත්තාවලිත්තං කාතුං"
එම - පි.134

76. "අනුජානාමි භික්ඛවෙ පඤ්ච ඡදනානි, ඉට්ඨකාඡදනං සිලාඡදනං සුධාඡදනං තිණච්ඡදනං පණ්ණච්ඡදනං"
එම - පි.156

77. "අනුජානාමි භික්ඛවෙ තීණි වාතපානානි, වෙදිකාවාතපානං ජාලවාතපානං සලාකවාතපානං"
එම - පි.134

78. "අනුජානාමි භික්ඛවෙ වාතපානචක්කලිකං" - එම - පි.134

79. "අනුජානාමි භික්ඛවෙ වාතපානකවාටකං වාතපානභිසිකං" .
එම - පි.134

80. "අනුජානාමි භික්ඛවෙ තයො සොපාණෙ, ඉට්ඨකාසොපාණං සිලාසොපාණං දාරුසොපාණං"
එම - පි.146

81. "අනුජානාමි භික්ඛවෙ බුද්දකෙ විහාරෙ එකමන්තං ගබ්භං කාතුං මහල්ලකෙ මජ්ඣෙ"
එම - පි.146

82. "අනුජානාමි භික්ඛවෙ තයො ගබ්භෙ, සිවිකාගබ්භං නාළිකාගබ්භං හම්මියගබ්භං"
එම - පි.146

83. "අනුජානාමි භික්ඛවෙ කුලුංකපාදකං" - එම - පි.146

84. "අනුජානාමි භික්ඛවෙ පරිත්තානකිටිකං උද්දසුධං" - එම - පි.148



85. "තං සබ්බමත්තිකාමයං කත්වා පාණිකාය සංසිත්වා සුක්ඛාපෙත්වා තෙලතම්බමත්තිකාය පරිමජ්ජිත්වා අන්තො ච බහි ච තිණාදීහි පූරෙත්වා යථා පක්කා සුපක්කා හොති එවං පචි. එවං පක්කා ච පන සා අහොසි කුටිකා."

සමන්තපාසාදිකා, පාරාජිකකණ්ඩං, දුතිය පාරාජිකං, CSCD, 1999 vri-1.230

86. "අනුජානාමි භික්ඛවෙ ආලින්දං පඝනං පකුඩ්ඩං ඔසරකං"
<u>චුල්ලවග්ගපාළි, II,</u> 2005 පි.148

87. "අනුජානාමි භික්ඛවෙ සංසරණකිටිකං උග්ඝාටනකිටිකං" - එම - පි.148

88. - එම - පි.142-144

89. "අනුජානාමි භික්ඛවෙ මාලාකම්මං ලතාකම්මං මකරදන්තකං පඤ්චපටිකං"
එම - පි.144

90. "අනුජානාමි භික්ඛවෙ චිනිතුං තයො චයෙ, ඉට්ඨකාචයං සිලිචයං දාරුචයං"
එම - පි.146

91. "අනුජානාමි භික්ඛවෙ මරුම්බං උපකිරිතුං" - එම - පි.152

92. "අනුජානාමි භික්ඛවෙ පදරසිලං නික්ඛිපිතුං" - එම - පි.154

93. "අනුජානාමි භික්ඛවෙ උදකනිද්ධමනං" - එම - පි.154

94. "තථා'පි අජකා'පි පසුකා'පි උපරොපෙ විහෙඨෙන්ති." - එම - පි.154

95. "අනුජානාමි භික්ඛවෙ තයො වටෙ වෙළුවටං කණ්ටකීවටං පරිඛං"
එම - පි.154

96. "අනුජානාමි භික්ඛවෙ කොට්ඨකං ආපෙසිං යමකකවාටං තොරණං පලිඝං"
එම - පි.156

97. "--- ආයස්මතා මහාමොග්ගල්ලානෙන නවකම්මාධිට්ඨායකෙන සුවිභත්තභිත්තිථම්භතුලාගොපානසීකණ්ණික-ද්වාරබාහවාතපානසොපාණාදිගෙහාවයවං මනොහරං සුවිකප්පිතකට්ඨකම්මරමණීයං සුපරිකම්මකතසුධාකම්ම- මනුඤ්ඤං සුවිරචිතමාලාකම්මලතාකම්මාදිචිත්තකම්මවිචිත්තං සුපරිනිට්ඨිතමණිඑලකසදිසභූමිතලං දෙවවිමානසදිසං හෙට්ඨාභූමියං පඤ්ච ගබ්භසතානි උපරිභූමියං පඤ්චගබ්භසතානී'ති ගබ්භසහස්සපතිමණ්ඩිතං බුද්ධස්ස භගවතො භික්ඛුසංඝස්ස ච වසනානුච්ඡවිකං මහන්තං පාසාදං තස්ස පරිවාරපාසාදසහස්සඤ්ච තෙසං පරිවාරභාවෙන කුටිමණ්ඩපචංකමනාදීනි ච කාරෙන්ති ---"
<u>විමානවත්ථු අට්ඨකථා,</u> (සංස්.) සිරි සුමන ධම්මසිද්ධි සිරි සිද්ධත්ථ හිමි ආදීහු, හේවාවිතාරණ පුනර්මුද්‍රණය, (වර්ෂය සඳහන් වී නැත.) පි.151